දෙවන වාර පරීක්ෂණය* 2018

මතුගම අධ්‍යාපන කලාපය

| නාට්‍ය හා රංග කලාව | 8 | කාලය පැය 02 යි |
| --- | --- | --- |

නම/විභාග අංකය ----------------------------------- පන්තිය ------

සැලකිය යුතුයි

- ❖ ප්‍රශ්න පත්‍රය i කොටස හා ii කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි .
- ❖ i කොටසේ ප්‍රශ්න සියල්ලටම හා ii කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සැපයිය යුතුයි.

---

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(1) නාට්‍ය පිටපතක් නිර්මාණයේදී වැදගත් වන අභිනයකි

(1) ආංගික (2) වාචික (3) සාත්වික (4) ආහාර්ය

(2) සමාරෝපයේ ප්‍රධාන කොටස් දෙක

(1) උඩ හා යට (2) අභ්‍යන්තර හා බාහිර (3) සරල හා සංකීර්ණ (4) සංවෘත හා විවෘත

(3) නාට්‍ය පෙළ යනු

(1) නාට්‍ය පිටපතයි (2) තිර පිටපතයි (3) කාර්මික පිටපතයි (4) රංගාලෝකයයි

(4) න' නිළියන් තෝරා ගැනීම

(1) න'වරණයයි (2) අනුකරණයයි (3) සමාරෝපයයි (4) අනුරූපණයයි

(5) දේශාභිමානී චරිතයක් වූයේ

(1) දික්තලා (2) කාලගෝල (3) ගමදූව (4) මද්දුම බන්ඩාර

(6) සාමූහික ක්‍රියාවකි

(1) පොල් කැඩීම (2) ළමයෙක් සිනාසීම

(3) වෙළදාම් පොළ (4) මිනිසෙක් ගලක් ගැසීම

(7) යමක් සිතා මවා ගැනීම

(1) සමාරෝපයයි (2) අනුකරණයයි (3) පරිකල්පණයයි (4) ර පෑමයි

8 - 12 දක්වා සුදුසු වචන වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න

(8) හ■ අභයාසයක් සඳහා යොදා ගන්නා ග්‍රන්ථයකි ..............................................

(9) නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්නේ .............................................. විසිනි

(10) ඩී. කුමාරගේ නාට්‍ය නිර්මාණය වන්නේ ..............................................

(11) න' නිළියන්ගේ මුහුණු චරිතයට උචිත ලෙස සැකසීම .............................................. වේ

(12) ස්මරණය හා ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා

.............................................. අවශ්‍ය වේ

( රංග ක්‍රීඩා, පෙළ රචක, වලහා හා මාෂා, අංගරචනය බුද්ධ ගජ්ජය )

13-20 දක්වා ප්‍රශ්න වල ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශය නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියේ දී තිබෙන වරහන තුළ යොදන්න

(13) නාට්‍යයට උචිත ලෙස පසුතල නිර්මාණය කළ යුතුය (.........)

(14) වේෂ භූෂණය යනු ඇඳුම් පැළඳුම් වේ (.........)

(15) වලහා හා මාෂා ළමා නාට්‍යයක් නොවේ (.........)

(16) රංග භාණ්ඩ යනු න' නිළියන් රංගනයේදී භාවිතා කරනු ලබන භාණ්ඩ වේ (.........)

(17) පරිකල්පනය නාට්‍ය නිර්මාණයේදී අවශ්‍ය නොවේ

(18) ආගමික කතාවක් ලෙස සමරිතානු වරයාගේ කතාව දැක්විය හැකිය (.........)

(19) නදනදඅන්දම් කරුවලේ සොහොනේ සිටින්නේ"" ශාන්ති කර්ම කවියකි (.........)

(20) නාට්‍ය පෙළෙන් කියවෙන ප්‍රධාන අදහස තේමාව වේ (.........)

(20 1= 20)

## ii කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.

i චරිතය : (ඇද කරයි ) අෑ.........හොහ්........ හො......
ii චරිතය : මට ගෙදර යන්න ඕ.......... නා........ (අඬයි)
i චරිතය : හොඳයි . මම පාර කියන්නම්. හැබැයි මම අහන ඒවට උත්තර දෙන්න ඕනා.
ii චරිතය : (ඇකුළුම් ස්වරයෙන්) හා........ අහන්න බලන්න
i චරිතය : මෙයාට උත්තර දෙන්න බැරි ප්‍රශ්න අහන්න ඕනා. කැලේ ගැන දන්නවද?

(1) (1) මෙම සංවාද ඛණ්ඩය අයත් නාට්‍යයේ නම හා නිර්මාණකරුගේ නම ලියන්න (ලකුණු 02)

(2) මෙහි සඳහන් i හා ii චරිත නම් කරන්න (ලකුණු 02)

(3) මෙහි ඇති රංග විධාන 02ක් ලියන්න (ලකුණු 02)

(4) මෙහි එන චරිතයන්හි ලක්ෂණ දෙක බැගින් ලියන්න (ලකුණු 02)

(5) මෙම නාට්‍යයේ තවත් චරිතයක් නම් කරන්න (ලකුණු 02)

(2) (1) වේෂ භූෂණවල ප්‍රධාන කොටස් දෙක නම් කරන්න (ලකුණු 02)

(2) නාට්‍යයක වේෂ භූෂණ නිර්මාණයේදී සැළකිලිමත් විය යුතු කරුණු 03ක් නම් කරන්න (ලකුණු 03)

(3) ඔබ කැමති චරිතයක් සඳහා වේෂ භූෂණයක් නිර්මාණය කරන්න ( රූප සටහන ඇඳ නම් කරන්න (ලකුණු 05)

(3) (1) රංග අභ්‍යාස යනු කුමක්දැයි පැහැදිලි කරන්න (ලකුණු 02)

(2) රංග අභ්‍යාස 03 ක් නම් කරන්න (ලකුණු 03)

(3) ඔබ පන්ති කාමරයේදී සිදුකළ රංග අභ්‍යාසයක් ලියන්න (ලකුණු 05)

(4) (1) ආනුෂංගික අංග යනු මොනවාද? (ලකුණු 02)

(2) ආනුෂංගික අංග තුනක් නම් කරන්න (ලකුණු 03)

(3) ආනුෂංගික අංග නිර්මාණයේදී සැළකිළිමත් විට යුතු කරුණු දෙකක් දක්වා විස්තර කරන්න (ලකුණු 05)

(5) ඔබ දන්නා ජාතක කතාවක් හෝ වෙනත් ආගමික කතාවක් පදනම් කරගෙන කෙටි නාට්‍ය පෙළක් ලියන්න (ලකුණු 05)

(3X10=30)
(මුළු ලකුණු 50යි )